# ප්‍රසම්පාදන දැන්වීමයි

## පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව -සබරගමුව පළාත

පහත සඳහන් වැඩ විෂය සඳහා පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාවේ ලේකම් හා බලතල කාර්ය , කර්තව්‍ය ක්‍රියාත්මක කිරීමේ නිලධාරී විසින් 2024.05.28 වන දින සිට 2024.06.12 වන දින පෙ.ව 11.00.දක්වා ලංසුකරුවන්ගෙන් මුද්‍රා තබන ලද ලංසු භාර ගැනේ .

| අනු අංකය | වැඩ විෂයය | දළ ඇස්තමේන්තු වැඩ වටිනාකම (රු.මි) | ආපසු නොගෙවන ටෙන්ඩර් ගාස්තු (රු) | ආපසු ගෙවනු ලබන ලංසු බැඳුම්කර (රු) | කොන්ත්‍රාත් ලියාපදිංචි වටිනාකම |
|---|---|---|---|---|---|
| 01 | යෝජිත හෙළබොජුන්හල ඉදි කිරීම කෙටේතැන්න-කහවත්ත | 17.9 | 7500.00 | 179,500.00 | C6 /C5 |

02. මෙම ලංසු කැඳවීම විවෘත තරඟකාරී ප්‍රසම්පාදන ක්‍රියාපටිපාටිය යටතේ සිදුකරනු ලබන අතර ,මෙම කර්මාන්තය රු.මි 50.ට වඩා අඩු බැවින් රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ අංක (2016/04/02) අනුව ප්‍රාදේශීය ප්‍රමුඛතා හා අදාල (CIDA) ශ්‍රේණිගත ප්‍රමුඛතාවය පදනම් කර ගනිමින් ගොඩනැගිලි ඉදිකිරීම් සඳහා ලංසුකරුවකු තෝරාගැනීම සිදුකරනු ලැබේ. එම චක්‍රලේඛයට අදාලව පසුව නිකුත් කරන ලද රාජ්‍ය මූල්‍ය චක්‍රලේඛ (2023/03,2023/03) හා (2016/04) යන චක්‍රලේඛයන්ද ප්‍රසම්පාදන කටයුතු සඳහා අදාල වේ.

03. 2024.05.28 වන දින සිට 2024.06.11 දින දක්වා සතියේ වැඩ කරන දිනයන්හි පෙ.ව 9.00.සිට ප.ව 3.00. දක්වා ඉහත සඳහන් පරිදි ගාස්තු ගෙවීමෙන් පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයෙන් ලංසු ලේඛන ලබාගත හැකිය.

.04 සියළුම ලංසුකරුවන් මෙම කර්මාන්තය සඳහා ඉහත සඳහන් ලංසු බැඳුම්කර වටිනාකමට අදාලව ලංසු බැඳුම්කර වශයෙන් පිළිගත් වාණිජ බැංකුවකින් ලබාගත් ලංසු බැඳුම්කරයක් 2024.06.12 දින සිට 2024.10.08 දින දක්වා වලංගු වන පරිදි "ලේකම් ,ප්‍රාදේශීය සභාව, පැල්මඩුල්ල" ප්‍රතිලාභියා ලෙස නම් කර ලබාගත් ලංසු බැඳුම්කරයක් මඟින් හෝ අදාල කර්මාන්තය නමින් ලංසු සුරක්ෂණ මුදල ලෙස ප්‍රාදේශීය සභාවේ අදාල මුදල් තැන්පත් කර ලබාගත් රිසිට්පත ලංසු ලේඛන සමඟ ඉදිරිපත් කල යුතුය.

.05 මෙම කර්මාන්තය පිළිබඳ විස්තර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව වෙත පැමිණ හෝ දුරකථන අංක 0452274375 වෙතින් කාර්යාල වේලාවන් තුලදී ලබාගත හැකිය .අවශ්‍ය අයෙකුට සතියේ වැඩකරන දිනයන්හිදී නොමිලේ ලංසු ලේඛන පරීක්ෂා කර බැලිය හැක

06. මුද්‍රා තබන ලද ලංසු 2024.06.12 වන දින පෙ.ව. 11.00 ට හෝ ඊට පෙර පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේ මුද්‍රාතබන ලද පෙට්ටියට ගෙනැවිත් බහාලිය හැකි වේ .ප්‍රමාද වී ලැබෙන ලංසු ප්‍රතික්ෂේප කරනු ලබන අතර ,මිල ගණන් බහාලන කවරයේ ඉහල වම් කෙළවරේ කර්මාන්තයේ නම සඳහන් කල යුතුය.තවද කර්මාන්තයට අදාල අනුපිටපත වෙනම කවරයක බහා කවරයේ ඉහල වම් කෙළවරේ කර්මාන්තයේ නම සහ අනුපිටපත ලෙස සඳහන් කර ඉදිරිපත් කල යුතුය.

07. 2024.06.12 වන දින පෙ.ව.11.15 ට පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා කාර්යාලයේදී ලංසු විවෘත කරනු ලැබේ . ලංසු විවෘත කරනු ලබන අවස්ථාවට ලංසුකරු හෝ බලයලත් නියෝජිතයෙකුට සහභාගි විය හැකිය.

08. ලංසුපත් සම්පූර්ණයෙන් හෝ භාගික වශයෙන් පිළිගැනීමෙ හෝ ප්‍රතික්ෂේප කිරීමේ අයිතිය පැල්මඩුල්ල ප්‍රාදේශීය සභා ප්‍රසම්පාදන කමිටුව සතුවේ.

09. සියළුම ලංසු 2024.09.10 දක්වා වලංගු විය යුතුය.

සභාපති,
ප්‍රසම්පාදන කමිටුව,
පැල්මඩුල්ල ප්‍රාදේශීය සභාව,
පැල්මඩුල්ල

2024.05.27 වන දින,